# සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

## ආයුර්වේද දෙපාර්තමේන්තුව

### 111 ශ්‍රේණියේ හෙද නිලධාරී තනතුරට කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම

මේ වන විට පුරප්පාඩුව පවතින ආයුර්වේද දෙපාර්තමේන්තුව යටතේ වන පහත දක්වා ඇති රෝහල් වල 111 ශ්‍රේණියේ හෙද නිලධාරී තනතුරට රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ අංක 03/2018 විධිවිධාන යටතේ කොන්ත්‍රාත් පදනම මත නිලධාරීන් බඳවාගැනීම සෞඛ්‍ය,පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ දේශීය වෛද්‍ය අංශයේ අංක 01/13/03/12-111 හා 2019.05.22 දිනැති ලිපියෙන් අනුමත කර ඇත.

| ආයතනය | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|
| බොරැල්ල ආයුර්වේද ශික්ෂණ රෝහල | 05 |
| බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණායතනය | 02 |
| චමල් රාජපක්ෂ ආයුර්වේද රෝහල | 10 |
| අම්පාර ආයුර්වේද රෝහල | 05 |
| කෝණේෂ්පුරි ආයුර්වේද රෝහල | 08 |
| මැදවච්චිය ආයුර්වේද රෝහල | 01 |
| යුනානි පර්යේෂණ රෝහල | 04 |
| **එකතුව** | **35** |

02. ඒ අනුව පහත සුදුසුකම් සහිත විශ්‍රාමික හෙද නිලධාරීන්ට ඒ සඳහා අයදුම් කළ හැකිය.

I. 2019.06.30 දිනට වයස අවුරුදු 65 ට අඩු අවම වශයෙන් එක් වසරක කාලයක් සේවය කිරීමට හැකියාව ඇති රජයේ හෙද නිලධාරියෙකු/ නිලධාරිනියක වීම.
II. විනයානුකූල කටයුතු කිරීමකින් තොරව, අනිවාර්ය විශ්‍රාම යාමේ වයසට එළඹීම හේතුවෙන් විශ්‍රාම ලබා ඇති නිලධාරීන් වීම.
III. තවදුරටත් සේවය කිරීමට හැකි ශාරීරික හා මානසික වශයෙන් සුදුසු නිලධාරීන් බවට වෛද්‍ය නිර්දේශයක් මගින් තහවුරු කිරීම.

03. සැලකිය යුතුයි

I. කොන්ත්‍රාත් පදනමින් බඳවා ගනු ලබන නිලධාරීන්ට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2018 අනුව මාසික පාරිශ්‍රමිකයක් ලබාදෙනු ලැබේ.

II. විශේෂ ශ්‍රේණියේ තනතුරු වල සේවය කර විශ්‍රාම ලබා ඇති ඉහත සේවාවන්ට අයත් නිලධාරීන් මේ සඳහා අයදුම් කරන්නේ නම් ඔවුන් ද නැවත සේවයේ යොදවනු ලබන්නේ 111 ශ්‍රේණියේ තනතුරු වලය.

04. අයදුම් කළ යුතු ආකාරය

I. මේ වන විට රාජ්‍ය සේවයෙන් අනිවාර්ය විශ්‍රාම ලබා ඇති හෙද සේවයේ නිලධාරීන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ ඇතුළත් EST – 01 ආකෘතිය ප්‍රකාරව සකස් කරන ලද අයදුම්පත්‍රයක් තමන් අවසන් වරට සේවය කරන ලද ආයතන ප්‍රධානියා මගින් ඔහුගේ/ඇයගේ නිර්දේශ සහිතව ආයුර්වේද කොමසාරිස් වෙත අතින් ගෙනවිත් භාරදීම මගින් හෝ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුය.
(ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කිරීම සඳහා භාවිතා කළ යුත්තේ EST – 01 ආකෘති පත්‍රය පමණක් විය යුතුය.)

05. අයදුම්පත්‍රය සමග පහත ලිපි ලේඛන ඉදිරිපත් කළ යුතුය.

I. නිලධාරියාගේ ඉල්ලීම
II. නිලධාරියාගේ ජීව දත්ත පත්‍රිකාව
III. රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ අංක 03/2018 යටතේ ඉදිරිපත් කරනු ලබන අයදුම්පත්‍රය
IV. නිලධාරියා රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගැන්වූ ලිපියේ සහතික කළ පිටපතක්
V. ජාතික හැඳුනුම්පතෙහි සහතික කළ පිටපතක්
VI. උප්පැන්න සහතිකයේ සහතික කරන ලද පිටපතක්
VII. වෛද්‍ය වාර්තාව ( ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කරන දිනට සති 04 ක කාලයක් ඇතුලත දී ලබාගත් )

06. අයදුම්පත්‍ර යොමු කළ යුතු ලිපිනය

ආයුර්වේද කොමසාරිස්
ආයුර්වේද දෙපාර්තමේන්තුව
පරණ කොට්ටාව පාර
නාවින්න
මහරගම

07. අයදුම්පත් භාරගැනීමේ අවසන් දිනය - 2019.07.15

08. මෙම නිවේදනයේ සිංහල,දෙමළ හා ඉංග්‍රීසි භාෂාවන් අතර යම් පරස්පරතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා මාධ්‍ය පිටපත බලපැවැත්විය යුතු වන්නේය.

බී.එම්.නිමල් බාලසූරිය
ලේකම්
සෞඛ්‍ය,පෝෂණ හා දේශීය වෛද්‍ය රාජ්‍ය අමාත්‍යාංශය
2019.07.01

Source: www.ayurveda.gov.lk/ (2019.07.11)